මාධ්‍ය නිවේදනය

සන්නිවේදන දෙපාර්තමේන්තුව, 30, ජනාධිපති මාවත, කොළඹ 01, ශ්‍රී ලංකාව
+94 11 2477424 / +94 11 2477423 +94 11 2346257
communications@cbsl.lk / dcommunications@cbsl.lk www.cbsl.gov.lk

ශ්‍රී ලංකා මහ බැංකුව
இலங்கை மத்திய வங்கி
CENTRAL BANK OF SRI LANKA

| | |
|---|---|
| නිකුත් කළේ | සංඛ්‍යාන දෙපාර්තමේන්තුව |
| දිනය | 2021.08.06 |

# ඉඩම් තක්සේරු දර්ශකය[1] - 2021 වසරේ පළමු භාගය

## සුවිශේෂී කාර්යසාධනයන්

| ඉඩම් තක්සේරු දර්ශක අගය | වාර්ෂික වැඩිවීම |
|---|---|
| 155.1 | 9.5 % |
| | අර්ධ වාර්ෂික[2] වැඩිවීම |
| | 6.8 % |

### ඉඩම් තක්සේරු දර්ශකයෙහි වාර්ෂික වර්ධනය




### 2017 වසරේ සිට ඉඩම් තක්සේරු දර්ශකයේ භූ ගෝලීය ආවරණය : කොළඹ දිස්ත්‍රික්කය



මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

කොළඹ දිස්ත්‍රික්කයෙහි ඉඩම් තක්සේරු දර්ශකය 2021 වසරේ පළමු භාගයේ දී 155.1 ක් දක්වා ඉහළ යන ලදී. පසු ගිය වසර දෙක තුළ දක්නට ලැබුණු ඉඩම් තක්සේරු දර්ශකයේ වැඩි වීම පහළ යාමේ ප්‍රවණතාවයට ප්‍රතිවිරුද්ධව යමින් ඉඩම් තක්සේරු දර්ශකයෙහි වාර්ෂික වර්ධනය 9.5 ක් ද අර්ධ වාර්ෂික වර්ධනය 6.8 ක් ද ලෙස වාර්තා විය.

ඉඩම් තක්සේරු දර්ශකයෙහි වර්ධනය සඳහා නේවාසික, වාණිජ හා කාර්මික යන ඉඩම් තක්සේරු අනු දර්ශක තුනෙහිම ඉහළ යාම හේතු විය. කාර්මික ඉඩම් තක්සේරු අනු දර්ශකය මගින් වැඩිම වාර්ෂික වර්ධනය වන සියයට 10.1 ක අගය වාර්තා වූ අතර, අනුපිළිවෙලින් නේවාසික සහ වාණිජ ඉඩම් තක්සේරු අනු දර්ශකයන්හි ද වර්ධනයන් දක්නට ලැබුණි.

### ඉඩම් තක්සේරු දර්ශකයෙහි විචලනය




### ඉඩම් තක්සේරු දර්ශකය සහ එහි වර්ධනය

| කොළඹ දිස්ත්‍රික්කය සඳහා ඉඩම් තක්සේරු දර්ශකය | දර්ශක අගය | | | | | වාර්ෂික වර්ධනය (සියයට) | | | අර්ධ වාර්ෂික[2] වර්ධනය (සියයට) | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| (පදනම් වර්ෂය: 2017 වසරේ පළමු භාගය) | 2019 පළමු භාගය | 2019 දෙවන භාගය | 2020 පළමු භාගය | 2020 දෙවන භාගය | 2021 පළමු භාගය | 2020 පළමු භාගය | 2020 දෙවන භාගය | 2021 පළමු භාගය | 2020 පළමු භාගය | 2020 දෙවන භාගය | 2021 පළමු භාගය |
| නේවාසික ඉඩම් තක්සේරු අනු දර්ශකය | 131.4 | 137.9 | 140.7 | 144.4 | 154.2 | 7.1 | 4.7 | 9.6 | 2.0 | 2.6 | 6.8 |
| වාණිජ ඉඩම් තක්සේරු අනු දර්ශකය | 132.2 | 138.8 | 141.6 | 145.1 | 154.0 | 7.1 | 4.5 | 8.8 | 2.0 | 2.5 | 6.1 |
| කාර්මික ඉඩම් තක්සේරු අනු දර්ශකය | 133.0 | 139.6 | 142.5 | 146.1 | 157.0 | 7.2 | 4.6 | 10.1 | 2.1 | 2.5 | 7.4 |
| **ඉඩම් තක්සේරු දර්ශකය** | **132.2** | **138.8** | **141.6** | **145.2** | **155.1** | **7.1** | **4.6** | **9.5** | **2.0** | **2.5** | **6.8** |

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

[1] ශ්‍රී ලංකා මහ බැංකුව විසින් සම්පාදනය කරනු ලබන ඉඩම් මිල දර්ශකය 2019 දෙවන කාර්තුවේ සිට ඉඩම් තක්සේරු දර්ශකය ලෙස ප්‍රතිනාමකරණය කර ඇත.

[2] පසුගිය අර්ධ වර්ෂයට සාපේක්ෂව මෙම අර්ධ වර්ෂයේ ඉඩම් තක්සේරු දර්ශකයේ ප්‍රතිශත වෙනස

## තාක්ෂණික සටහන:

### ආවරණය සහ කාල පරාසය

කොළඹ දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 5 ක් ආවරණය වන පරිදි 1998 සිට 2008 දක්වා වාර්ෂිකව ද 2009 සිට 2017 දක්වා අර්ධ වාර්ෂිකව ද ඉඩම් මිල දර්ශකය සම්පාදනය කරන ලදී. ඉන්පසු 2017 වසරේ සිට කොළඹ දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 13 ම ඇතුලත් වන පරිදි මෙම දර්ශකයේ භූගෝලීය ආවරණය පුළුල් කර, පදනම් වර්ෂය 2017 පළමු භාගය ලෙස සංශෝධනය කරන ලදී. මෙම ඉඩම් මිල දර්ශකය 2020 වසරේ සිට ඉඩම් තක්සේරු දර්ශකය ලෙස ප්‍රතිනාමකරණය කරන ලද අතර එය අර්ධ වාර්ෂිකව ප්‍රකාශයට පත් කෙරේ.

### දත්ත මූලය

රජයේ තක්සේරු දෙපාර්තමේන්තුවෙන් අර්ධ වාර්ෂිකව එක්රැස් කරගනු ලබන හිස් ඉඩම් පර්චසයක් සඳහා වන මිල ගණන් මේ සඳහා භාවිතා කෙරේ.

### ක්‍රමවේදය

ඉඩම් භාවිතය සම්බන්ධයෙන් පවත්නා විවිධත්වය සහ සමජාතීත්වය පවත්වා ගැනීමේ අවශ්‍යතාව යන කරුණු සැලකිල්ලට ගනිමින්, සෑම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයකම ඒ ඒ ප්‍රදේශයේ එක් එක් කාණ්ඩයට අයත් ඉඩම් පර්චසයක සාමාන්‍ය මිල උපයෝගී කර ගනිමින් නේවාසික, වාණිජ හා කාර්මික ඉඩම් කාණ්ඩ සඳහා අනු දර්ශක තුනක් ගණනය කරනු ලැබේ. එම අනු දර්ශක තුනෙහි සාමාන්‍යය ඇසුරෙන් ඉඩම් තක්සේරු දර්ශකය ගණනය කරනු ලැබේ.